සිනුවර නම පබැඳූ



හෙන්රි කුමාරප්පෙරුම

විෂ්ණුශර්ම පාදයන්ගේ පංචතන්ත්‍රයේ සිංහල කාව්‍යානුවාදය ලෙස 'වනරජදහන' නම්වූ ග්‍රන්ථ සංග්‍රහය ඔබ මහත් වෙහෙසක් දරා කාව්‍ය තුන් දහසකින් සමන්විතව අදට ද මතු පරපුර වෙනුවෙන් ද ඔබ කළ මහගු දායාදයක් , නැතිනම් භාෂාමය පුණ්‍ය කර්මයක් කීවොත්....?

පංචතන්ත්‍ර නම් වූ සංස්කෘත චම්පූ කාව්‍ය ග්‍රන්ථය ඉපැරණිය. මනහරය. දඹදිව්හි බමුණු පඬිවරයකු වන විශ්ණුශර්ම පාදයන් විසින් මෙය රචනා කර ඇත. මහිලාරෝප්‍ය නුවර අමර ශක්ති නම් රජුගේ පුතුන් තිදෙනාට තමාගෙන් පසු යහ රාජ්‍ය පාලනය ගෙන යායුතු අයුරු මින් ඉගැන්වේ. ලෝකායත ශාස්ත්‍ර ලෙසින් සමාජ සාර ධර්ම, නීතිය, දේශපාලනය, රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමවේද පිළිබඳ අධ්‍යාපනය ලබා දීම මෙහි අරමුණය.

මෙම පංචතන්ත්‍රය ලෝකයේ පෙරදිග මෙන් ම අපරදිග ද නොයෙකුත් රටවල විවිධ භාෂා විශාල ගණනකට විවිධ මුහුණුවරින් පරිවර්තනයවීමට මූල බීජයක් වී ඇති කෘතියක් ලෙස හඳුන්වන්න පුලුවන්. මෙයට සියවස් දහයකට පමණ පෙර සිට ම පර්සියානු, ලතින්, ග්‍රීක්, ස්ලෝවියානු ආදී ඉන්දු යුරෝපීය භාෂාවන් හා මැදපෙරදිග ශාස්ත්‍රීය භාෂාවක් වන හීබෘ භාෂාව හරහා ද මෙම කෘතියට අනුවාද සැපයී ඇති බවට විශ්ව සාහිත්‍යය තොරතුරු හෙළි කරනවා. ඔබඅප කවුරුත් දන්නා පරිදි ඊසොප්ගේ උපමා කතා කුඩා ළමයාගේ සිට මහල්ලා දක්වා එකසේ රස විඳිය හැකි කතන්දර, පංචතන්ත්‍රය ඇසුරින් සැකසී ඇති බව රහසක් නොවේ.

පසුගිය 2012 වසරේ මවිසින් එළි දක්වන ලද 'වනරජදහන' කාව්‍ය ග්‍රන්ථය මුලුමනින් ම පංචතන්ත්‍රයේ කාව්‍යමය ඡායානුවාදයයි. එය කවි තුන් දහසකින් පමණ සමන්විත වූවක්. කාව්‍ය සාහිත්‍යයේ සම්භාව්‍ය ලක්ෂණ මෙන් ම ගණ විරිත් එළිසම හා ව්‍යාකරණ විධි ද රැකෙන පරිද්දෙන් මෙම කව එළි දැකවීම පූර්වාදර්ශයක් මෙන්ම සතුටක්. සපුරා භාෂාමය මෙන් ම කාව්‍ය ලක්ෂණ, සාහිත්‍ය රස භාව පූර්ණ ගුණාංග සපුරා ලීමට හැම උත්සාහයක් ම දැරුවා.

සමාජයේ ළමා වියේ සිට විවිධ තරාතිරමේ කෙනෙකුට ම වැඩදායක වන උපදේශ කවි බසින් කියවෙනව. නීතිය, අධ්‍යාපනය, දේශපාලනය, සංස්කෘතිය, සාමාන්‍ය සමාජ සංකල්ප යන මේ කවර පැත්තකටත් අයත් වන හෝ උපදේශණයන් ගෙන් මෙම කෘතිය පිරී පවතිනවා. මෙම සියලු ඉගැන්වීම් වනසර සතුන් මාර්ගයෙන් ඉදිරිපත් කිරීම මෙහි දක්නා ලැබෙන විශේෂ තම කරුණ බව ද කිව යුතුය.

සාර ධර්ම පිරිහෙමින් පවතින මෙවන් යුගයක සාර ගුණාංග වඩා වර්ධනය කරගැන්මට මෙම ගතින් ලැබෙන පිටුවහල බොහෝ බව කිව යුතුයි. උපදේශන පිළිබඳ දැනුවත් වීමට සමාජ විශෝධනය උදෙසා ආයාසයෙන් තොරව සිත්හි බැහැව ගැන්මට සරළ වූ කාව්‍ය මාර්ගයෙන් රසවාදයන්ගෙන් පිරියනසේ එළිදක්වා ඇති මෙම කෘතිය හැමට වැඩදායක වනු ඇතැයි කිව යුතුයි. ඉතා පුරාණයේ සිට ම මානව සිතැගි මනරම්ව මිනිස් සිත් සතන් තුළට කාවැද්දීමට කාව්‍යය මගක් කරගත් බව නොරහසක්.

මෙම බැරෑරුම් කටයුත්ත වසර කිහිපයක පර්යේෂණ ප්‍රතිඵලයක්. අද දවසේ කාව්‍ය පිළිබඳ අප අතර ඇති උදාසීන කමත්, සාහිත්‍යයික ඇල්මේ ඌනතාවයත් කාව්‍ය ප්‍රකාෂණයෙහි අවහිරතාත් ලාභ නොලැබීමත් වැනි සාදක මෙවැනි ජාතික මෙහෙවර අවප්‍රමාණය වීමට හේතු වෙලා තියෙනව. එසේ තිබියදීත් මෙවන් මෙහෙවරක් ජාතියට මෙන් ම සාහිත්‍යයට එක් කරන්නට නොසැලෙන උත්සාහයක යෙදීමට හැකිවීම ඔබ කී පරිදි භාෂාමය පුණ්‍ය කර්මයක් හැටියට සැළකීමටත් පසුබට වන්නේ නැහැ.

සන්දේශ කාව්‍යය කියන්නේ ආශ්වාදනීය සාහිත්‍යාංගයක් ලෙස ඇතමුන් සඳහන් කරනවා, ඉන් ඉදිරියට මේ සන්දේශ කාව්‍යයන්හි කොතරම් වටිනා කමක් ගැබ්වනවා නොවේද....?

උත්කෘෂ්ට පණිවිඩයක්, කාරකයෙක්, හාරකයෙක් හා ග්‍රාහකයෙක් යන මේ චතුරාංගයන් ගෙන් සමන්විතව එළි දැක්වෙන කාව්‍යය සන්දේශ කාව්‍යයක් ලෙස සාහිත්‍යයේ විග්‍රහ වෙනව. අපගේ සිංහල සාහිත්‍යාවලිය දෙස බලන විට සන්දේශ නිර්මාණය පුලුල් සාහිත්‍යයේ එක් අංගයක් බවට පත්වී වර්ධනය වී ඇති බව පෙනෙනව. ඒ නිසාම අප එයට සන්දේශ සාහිත්‍යයැයි වහරනව. සන්දේශ කරණය සාහිතයයට එක්වන්නට වූයේ කාලිදාසයන් විසින් සංස්කෘතයෙන් ලියන ලද මේඝ දූතයෙන් පසුව බව එම ඉතිහාසය කියාදෙනවා. සිංහලයට එය එක්වූයේ ගම්පළ සමයේ ලියැවුණු මයුර සඳෙසෙනි. ඊටත් පැරණි අනුරපුර යුගයේ ද ලියැවුණු මයුර සඳෙසක් ගැන සඳහනක් ඇතත් එම ගත දැක ගන්නට නැත.

මෙසේ ආරම්භවී සිංහල සාහිත්‍යය ඔපවත් කළ මෙම සන්දේශාවලිය කාව්‍ය සාහිත්‍යයේ නියමුවා බවට පත් වන තරමට ම වර්ධනයක් පෙන්නුම් කරනවා. එතෙක් ජාතක කතාවක් ඇසුරෙන් වර්ධනය වී ආ කාව්‍ය සාහිත්‍යය සන්දේශ නාමයෙන් වෙනත් මගක් ගැනීමට නැඹුරු වීමක් ලෙස දක්වන්න පුලුවන්. මෙම නැඹුරුවීම සාහිත්‍යයේ නව නැම්මක් ලෙස විග්‍රහ කිරීම යෝග්‍යයි.

තම සිත්හි පුරා වැඩෙමින් තිබූ සිතුවිල්ලක් කිසියම් ආරම්මනයක් ඔස්සේ සිත් ගත් සතෙක් දූත කාර්යයෙහි යොදවා ග්‍රාහකයකු වෙත අසුන අත්පත් කරලීම මෙයින් සිදුකෙරේ. මේ සඳහා විශද කාව්‍ය මාර්ගයක් ඔස්සේ විවිධ වැනුම් එයට එක් කිරීමට කවියා දරා ඇති තැත විශ්මයාවහ යැයි කීවොත් එය අතිශයෝක්තියක් නොවනු ඇතැයි මට හැගෙනවා.අපගේ මන දොළ සපුරාලීමට ඔවුන් ගත් තැනට අප එම කවීනට නයගැති වෙනවා. එදා ඔවුන් ගොඩනැගූ භාෂාමය සාහිත්‍යමය මෙන් ම ආශ්වාදනීය නිර්මාණ සෙවනැලි යට අප ද පොඩියන් බවට පත්වී සිටිනව. මින් මතුවටත් අපේ බාල පරපුර ද අප සේ ම එම පොඩිත්වයට නෑකම් කියනු ඇත.

ප්‍රස්තුතය විසින් ද, ආකෘතිය විසින් ද, කාව්‍ය ලක්ෂන විසින් ද සඳෙස් කරුවා ගත් මග බෙහෙවින් කාලෝචිත බව එම කාව්‍යංගයන් දෙස විමසා බැලීමෙන් පෙනෙනු ඇත. අනේක වූ ගී විරිත් වලිනුත් සිවු පද, දෙපා සිතිලි ගී, කඩවක්, සැහැලි, සිලෝ, වන්නම් ආදී නොයෙකුත් තාල වලින් කියවෙන පද්‍ය වෙනුවට එක ම ආරක් හා සම්ප්‍රදායක් අනුගමනය කරමින් නිර්මිත සන්දේශ කාව්‍යය කොළඹ යුගය දක්වා විවිධ නම් ඔස්සේ එකම ආරකින් සාහිත්‍යයට පෝෂණයක් ලබා දී ඇති බව කිව යුතුය. ඒ තුළ අපට දක්නට ලැබෙන තත් කාලීන දේශපාලනික සමාජයීය භූගෝලීය මෙන් ම ඇදහීම් ආදිය ද විශේෂ තැනක් හිමිකර ගනී. රාජ්‍ය තාන්ත්‍රිකය සාමයික ක්‍රියා කලාප මෙන්ම ජන ජීවිතයේ විලාසිතා ඇතලු අනෙකුත් සාදක ද නොමඳව දක්නට ඇති නිසා කාලීන තොරතුරු ඉතිහාසයට එක්ව ඇත.

ඔබෙන් කියැවුනු පරිදි අද විද්වත්නු අශ්වාදනීය සාහිත්‍යාංගයක් ලෙස මෙම සන්දේශාවලිය හඳුන්වන්නේ එහි දක්කට ලැබෙන සුගායනීය, කර්ණ රසායන මෙන්ම ආහ්ලාදනීය බව මෙනෙහි කරමිනි. මයුර තිසර පරවි සැළලිහිණි කොවුල් වැනි සඳෙස් කාව්‍ය සම්භාව්‍ය ආරකින් ඔද වැඩී මියුරු විරිතින් හැඩගැසී සිය වස් ගණනක් එදා මෙදා තුර පහන් සිත් ඔද වඩාලූ හෙයින්මය. 15ස් වැනි සිය වස සවැනි පැරකුම්බා රාජ සමය සිංහල සාහිත්‍යයට ස්වර්ණමය යුගයක සළකුණු එක් කර ඇත. එයින් දිප්තිමත්ව බැබැලෙනුයේ සන්දේශ කරණයයි. එහි සදා මතකයේ රැඳෙනුයේ සැළලිහිණි පරවි ගිරා ආදීන්ගේ සුගායනයෙන් සිත් සතන් සනහා ලන සුගායනීය බවයි.

අද අප අත් විඳින මෙම පොඩිත්වය තවත් සියවස් ගණනක් යන තුරුත් බාල පරපුරට ද අත්විඳීමට අප මග පාදා දිය යුතුයි.

අපේ බස කෙමෙන් කෙමෙන් ඈත්වී පරිහානියට යන බව බොහෝ විද්වතුන් සඳහන් කරනවා. ඒ ප්‍රකාශනයට පිළියම අප අප විසින් ම සපයා ගතයුතු උත්තරයක් නොවේද....?

මේ ප්‍රශ්නයට උත්තර දීම නම් දෙපැත්ත කැපෙන ආවුදයකින් වැඩ කිරීම හා සමාන බව පළමුවෙන් කියන්න ඕනා. අපේ බස කියන්නෙ අපට ම ආවේණික බසක්. අප කවර කවර දේශ වල සිටියත් බසේ පෘථුල ව්‍යාප්තියක් සිදුනොවෙන බව අප තරයේ සිට ගතයුතු කරුණක්. ලෝක භාෂාවක් ලෙසින් ඉංග්‍රීසි භාෂාව ව්‍යාප්තවී ඇති තත්වයට අපේ මෙම බස ගෙනයා නොහැකියි. අපේ මව්බිම තුළත් කොටසකට සීමාවී ඇති බව නොරහසක්. අනෙක් කොටස් වලට ද එය වැළඳ ගැන්මට වඩා හලා දැමීමට ඇති අවකාශය වැඩිවෙමින් පවතිනව. භාෂාවේ අවශ්‍යතාවය එම භාෂාව හිමි ජාතිය සතු හිමිකමක්. ජාතිනත්වය අවතක්සේරු කරනා අයෙකුට භාෂාව පිළිබඳ උද්දාමයක් කොයි ලෙසකිනුත් ඇති නොවනු ඇත. උද්දාමය කෙසේ වෙතත් යම් තරමක උවමනාවක් වත් ඇති නම් එහිදු වටිනා කමක් දකිනවා. කෙසේ වෙතත් භාෂාවේ අවප්‍රමාණිය ලක්ෂණ කලින් කල මතු වෙනව. එයට ඇති හේතු සාදක චක්‍රාකාරව එළි දකිනව.

ව්‍යාකරණ පිළිබඳ අධ්‍යාපන පරිපාටිය ලිහිල් බව, ඉන් බිහි වන ගුරු පරපුර හරි දැනීමෙන් තොරවීම, ඔවුන්ගේ සිසු පරපුර භාෂා රීතීන් කෙරෙහි වික්ෂිප්ත වීම, ඔවුන්ගේ දරු මුණුපුරන් ඉන් ඈත්වී වෙනත් විකල්ප භාෂා කෙරෙහි ඇලුම් කිරීම, පූර්වාදර්ශකයන් නොදන්නා දේ දන්නා ලෙසින් මාධ්‍යය හෝ වෙනත් මාර්ග හරහා හෙළි කිරීම, නොදන්නා බවක් නොපිළිගැනීම, අත මිට සරු කර ගැන්ම උදෙසා භාෂා රීති හෝ ලක්ෂණ උල්ලංඝනය කිරීම, ලිහිල් මාධ්‍ය ප්‍රතිපත්ති වැනි කරුණු කාරණා බොහෝ සෙයින් ඉවහල් වී ඇත.

වෙනස්වන භාෂාවකට අලුත් දේ වැද්ද ගැනීමෙහි වරදක් නැත. ඒත් රීතිය ගුරු තන්හිලා සැළකීමෙන් පමණි. ඉංග්‍රීසි භාෂාව විවිධ ජාතීන් විසින් හසුරවනු ලැබෙතත් රීතියෙන් තොරව රීතියට පටහැණිව ඒ තුළට කාවැද්දිය නොහැකිය. අපේ බස හසුරුවන ඇතමෙක් භාෂාවේ පළමුවෙන් ම උගන්වනු ලබන උක්ත ආඛ්‍යාත ව්‍යවහාරය ද උල්ලංඝනය කරති. එසේ කරමින් ලේඛන සකසන බව පමණක් නොව ප්‍රසිද්ධ කරන බව ද රහසක් නොවේ. අනෙකුත් භාෂා විධි විධාන ගැන කවර කතාද?

සාහිත්‍යය ද කණකොක් හඬින් මුසපත් වන අවස්ථා සුලභය. සාහිත්‍යයේ උත්තරීය ගුණාංග, සම්භාව්‍ය ලක්ෂණ ලඝු කිරීම කෙරෙහි හිරියක් නැති තරම්ය. භාෂා රීතීන් සාහිත්‍ය ගුණාංග කාව්‍ය හා ගීත ලක්ෂණ හරයෙන් මෙන් ම සම්මුතියෙන් ද සුන් කොට පහළට ඇද දමන කලාවක් ඉදිරියේ ඒවාට වන හානි පිළිබඳ වග කිවයුත්තන් ගෙන් තොරව ම අයාලයට ගොස් ඇත.

භාෂාව අපෙන් ඈත්වීම කෙරෙහි බලපාන සාධකවල වර්ධන වේගය මැණිය නොහැකි තරමට ඉහළ ගොස් ඇති බවට අප රටේ ඇති ඇතැම් ගුවන් විදුලි නාලිකා ප්‍රකාෂණ හා සමහර පුවත්පත්හි වාර්තා ද නිදසුන්ය. අපේ දේ ගැන අපේ කම ගැන සුභවාදී ආකල්ප අප විසින් ම ග්‍රහණය කළ යුතු කාලය හෙටට කල් දැමීම අනාගත පරපුර වෙනුවෙන් සුසුම් හෙළීමේ පළමු පියවර වනු ඇත කියලයි මට හිතෙන්නෙ.

මෙතෙක් පොත පතින් රස විඳි සහ කරුණු කාරණා උකහා ගත් බොහෝ දෙනා මෙන් ම අද නව පරපුර ද ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය වලට ඇබ්බැහි වීමක් දක්නට ලැබෙනව, ඒ නිසා ම නව තාක්ෂණය ඇසුරු කළ E-Book නමැති උපාංගය විශ්ව භාෂාවෙන් අපට ලැබුනත් අපේ බසට ඉන් ගත හැකි ප්‍රයෝජනය ගැන කිව්වොත්.....?

සිතුවිලි සෙල් ලිපියක් බවට පත්වුන. මතකය පොතක් බවට පත්වුන. කාර්මික විප්ලවයේ අනුහස මුද්‍රණ ශිල්පය හරහා ජීවිතවලට බලපෑවා. එම බලපෑම දැණුම් සම්භාරයක් වී අද නොයෙක් පැති කඩ ඔස්සේ මිනිස් ඕනෑ එපා කම් ඉෂ්ඨ කරමින් තව තවත් ඉදිරිය කරා ගමන් ගන්නා බව පේනවා. මෙහිදී අපේ සැළකිල්ල යොමු විය යුත්තේ, යොමු කළ යුත්තේ කෙසේදැයි විමසා බැලීම වටිනවා.

අධිවේගී තාක්ෂණ කවුලුවකින් අනාගතය දෙස නෙත් සිත් යොමු කිරීම තුළ අප ලබන අපේක්ෂා සක්ෂාත් කරණය හෝ අපේක්ෂා විභෙදනය සිදුවන්නට පුලුවන්. මෙතෙක් පොත පතින් අප ලබාගත් සේවාව අප යම් තැනක රඳවාඇත. දර්ශනයෙන්, වින්දනයෙන් හා චින්තනයෙන් ඉහළයන් ලෙසින් කටයුතු කිරීමට ඔවුනට පොත පත ඉමහත් රුකුලක් වූ බව නොරහසකි.

එදා වැලිපිල්ලෑවේ ලියූ අකුරු ඔහුගේ මොළයේ තැන්පත්වූයේ ගලේ කෙටුවක් ලෙසිනි. එතැන් සිට පොතට, පතට, අකුරට, කවියට, කතාවට, මතකය සැපවූයේ මහගු මෙහෙවරකි. මහා දැනමුත්තෙක්, මහා වෙදැදුරෙක්, මහා විද්‍යාඥයෙක්, මහා ප්‍රාඥයෙක් හෝ මහගු මිනිසෙක් කළේ ඒ මතකයයි. සංවේදී මිනිසෙක් කළේ ඒ මතකයයි. රසඥතා ඇත්තකු කළේ ඒ ආඝ්‍රාණයයි.

අද දවසේ නූතන පරපුර ඔවුනොවුන් පරයා යන තාක්ෂණයේ නවමං තුළ ගොනුවීමක් දක්නට ලැබෙනවා. EBook සංකල්පය හමුවේ විශ්ව ගම්මානය නව පරපුරට නොසිතූ විරූ නව මං පෙත් විවර කරදෙන බවක් පේනවා. කොම්පියුටරය හා අන්තර් ජාලය ලොව ඇති සියලු හොඳ නරක එක්තැන් කළ අසුරක් සැණින් ඇවැසිය එළියට ගත හැකි මංජුසාවක් බවට පත්ව ඇත. එහිදී දැණුම ආඝ්‍රාණය කරගැන්මේ ප්‍රවනතාවය පොතක ස්පර්ෂය තරම් නොවනු ඇත.

මෙම E-book සංකල්පය තුළට සිංහල බස කැවීම ලෝක ජනගහනයෙන් අතලොස්සක් වන සිංහලයන්ගෙන් තව දුරටත් එම භාෂාව ඈත්වීමට කරුණක් වනු ඇති බව සිතේ. පොත පත වටා ඇති ව්‍යාපාර ද අඩපණ වීමට හේතුවක් වනු ඇත. මෙය දීර්ඝ ලෙස කතා බහට ලක් විය යුත්තක් සේ දැනේ.

කල්දෙමුල්ල